**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
**දෙපාර්තමේන්තුගත නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය**

1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/29 හා 2022.12.14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධානවලට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

2.1 අදාළ නිලධරයන්

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ වේ.

i. රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය (II/I ශ්‍රේණි)/ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ii. ලේඛන සහකාර සේවය (III/II/I ශ්‍රේණි)
iii. පොත් බැඳුම්කරු සේවය (III/II/I ශ්‍රේණි)

2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය

2.2.1 එකම සේවා ස්ථානයක අඛණ්ඩව වසර 03 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක හෝ එකම දිස්ත්‍රික්කයක් තුල වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු වීම් වලට යටත් වේ. (එකම දිස්ත්‍රික්කයක් තුල සේවා ස්ථාන එකකට වැඩි ගණනක් පැවතිය හැක)

2.2.2.1 අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන් සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවා කාලය වසර 05 යනු එකම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම හෝ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කීපයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම ලෙස සලකනු ලැබේ.

3. ක්‍රමවේද සහ අනෙකුත් කරුණු

i. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදයේ යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් සලකා බැලිය හැකිය.

ii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇතිවිට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

iii. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේ දී සේවා අවශ්‍යතාවයන් ද කාර්යාලවල කාර්ය මණ්ඩල සමබරතාවය රැකීමට ද හැම විටම උත්සහ කල යුතු වේ.

iv. වාර්ෂික ස්ථාන කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරු වීම් ලබා දීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

4. සේවා කාලය ගණනය කිරීම

i. වාර්ෂික ස්ථාන මාරු වීම්වලදී කාල ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා :- 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2023.12.31 දිනය)

ii. සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කල දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරනු ලැබේ. (තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

5. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

I. නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
II. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් යන නිලධාරීන්ගෙන් දෙදෙනෙක්
III. දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු භාර පරිපාලන නිලධාරිවරයෙක්
IV. වාර්ෂික ස්ථානමාරු කමිටුවේ විෂය පථයට අයත්වන නිලධර කණ්ඩායම් හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම ලියාපදිංචි වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙකු බැගින් සමන්විත ස්ථාන මාරු කමිටුව මගින් මාරු වීම් සිදු කල යුතු වේ.

6. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

I. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
II. නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙක්
III. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් යන නිලධාරීන්ගෙන් දෙදෙනෙක්
IV. වාර්ෂික ස්ථානමාරු කමිටුවේ විෂය පථයට අයත්වන නිලධර කණ්ඩායම් හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම ලියාපදිංචි වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙකු බැගින් සමන්විත වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව මගින් මාරු වීම් සිදු කල යුතු වේ.

7. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

7.1 විශේෂිත කරුණු

i. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයකට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතුය.

ii. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

7.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්

i. වයස අවු 53 ට වැඩි නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කල නොහැකි අතර, දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කල හැකිය.

ii. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා 2024 වර්ෂය සඳහා 2023.12.31 දිනට) අවු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකල යුතුය.

7.3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය

i. කිසියම් වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හෝ විධායක මණ්ඩලයේ සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගත යුතුය. මෙම ස්ථාන මාරු කාර්යය පටිපාටියේ දී වෘත්තීය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ එක් සේවාවක් පමණක් නියෝජනය කරනු ලබන වෘත්තීය සමිති වේ. (කෙසේ වෙතත් සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු සිදු කිරීමේ දී මෙම සාධකය සැලකිල්ලට ගත යුතු නොවේ.)

8 2024 වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| ජුලි 01 ට පෙර | ස්ථාන මාරු පටිපාටිය සකස් කර ගැනීම |
| ඔක්තෝම්බර් 19 ට පෙර | වාර්ෂික ස්ථානමාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| නොවැම්බර් 02 ට පෙර | ආයතන/කාර්යාලයීය ප්‍රධානියා විසින් නිර්දේශ කරන අයදුම් පත් යොමු කිරීම |
| නොවැම්බර් 14 ට පෙර | ස්ථාන මාරු කමිටු රැස් වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම |
| නොවැම්බර් 24 ට පෙර | ස්ථාන මාරු තීරණ දැන්වීම සහ වාර්ෂික ස්ථානමාරු යොජනා සමාලෝචන කමිටු පත් කිරීම |
| දෙසැම්බර් 08 ට පෙර | ස්ථානමාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය |
| දෙසැම්බර් 19 ට පෙර | එම අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටු මඟින් තීරණ ගැනීම |
| දෙසැම්බර් 29 ට පෙර | සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම අවසන් කිරීම |
| 2024 ජනවාරි 01 | වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම |

9. වාර්ෂික ස්ථානමාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

i. ස්ථාන මාරුවීම ඉල්ලීමේ දී හා අභියාචනා ඉදිරිපත් කිරීමේ දී සලකා බැලිය යුතු වන්නේ ඒ සඳහා සකස් කර ඉදිරිපත් කරනු ලැබූ ආදර්ශ අයදුම් පත් මඟින් කරනු ලබන ඉල්ලීම් පමණි.

ii. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්